(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 8]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2009 ජුනි මස 24 වැනි බදාදා පූ. භා. 9.30 ට

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0030/'09

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB) ඉන්දියාවේ ICICI බැංකුවෙන් ඇ.ඩො. මිලියන 50 ක් ණයට ගෙන එම මුදල රජයට ණයට දී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම මුදල ණයට ගැනීමේදී හා නැවත ණයට දීමේදී එකඟ වන ලද කොන්දේසි පිළිබඳ සම්පූර්ණ විස්තර කවරේද;

(ii) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයට පෙර මේ හා සමාන ගනුදෙනු සිදුකර තිබේද;

(iii) එසේ නම්, එම ගනුදෙනු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය —

(i) විසින් මෙවැනි ගනුදෙනු සිදුකරනු ලැබීම සඳහා එහි පාලක ව්‍යවස්ථාව මගින් එම අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පවරා තිබේද;

(ii) මෙවැනි විදේශ මුදල් ගනුදෙනු වල යෙදීමේ උපාය මාර්ගයෙහි විචක්ෂණශීලී බව සහ ඇතිවිය හැකි අවදානම සලකා බලා තිබේද;

(iii) රජය හෝ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාර ලේකම් විසින් ඉහත ක්‍රියාමාර්ගය ගැනීමට මෙහෙයවනු ලැබූවේද සහ එවැනි මෙහෙයවීමක් කිරීමට මුල් වූ කරුණු කවරේද;

(iv) මහ බැංකුවෙන් විශේෂ අවසරය ලබාගෙන තිබේද;

(v) සහ ඉහත බලධාරීන් දණ්ඩ නීති සංග්‍රහයට අනුව දඬුවම් ලැබිය හැකි, බලය අනිසි ලෙස භාවිත කිරීමේ ක්‍රියාවක යෙදී තිබේද;

(vi) සිය වගකීම් සහ වගකිව යුතු බව පිළිබඳ අවබෝධයෙන් යුතුව පරිපූර්ණ අවදානම් සමාලෝචනයක් සිදුකර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0099/'09

2.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ සියලුම පාසල්වල සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් උපාධිධාරී ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) උපාධිධාරී ගුරුවරුන් අතුරින් කලා, වාණිජ, විද්‍යා හා වෙනත් උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) උසස් පෙළ විෂයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන හෝ ඉගැන්විය හැකි ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) එම උපාධිධාරීන් අතුරින් ඉංග්‍රීසි විෂයය උපාධිය සඳහා හදාරා ඇති හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය ලබාගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(vi) මෙම උපාධිධාරීන් අතුරින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සමත්වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක් නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0199/'09

3.

ගරු ජේමසිරි මානගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල නගරයට යාබදව ඉදිපොකුණගොඩ හරහා මාර්ගය ඉදිකෙරෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය ඉදිකිරීම සඳහා වැයකරන මුදල කොපමණද;

(ii) දික්වැල්ල - තංගල්ල හා දික්වැල්ල, බෙලිඅත්ත - තංගල්ල යනුවෙන් මාර්ග දෙකක් තිබියදී අලුතෙන් මාර්ගයක් ඉදිකරන්නේ කවර හේතු නිසාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම මාර්ගය සඳහා වැයකරන මුදල හම්බන්තොට දිස්ත්‍රික්කයේ දුප්පත්කම තුරන්කිරීම සඳහා භාවිතා කිරීම වඩාත් ඵලදායී බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0312/'09

4.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 2000 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා අස්වද්දනු ලැබූ කුඹුරු අක්කර ප්‍රමාණය එක් එක් වර්ෂයට අදාළව කොපමණද;

(ii) 2008 වර්ෂය වන විට වාර්තා වී ඇති කුඹුරු අක්කර ප්‍රමාණයෙන් පුරන් වූ කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වාර්ෂිකව ලබා දී ඇති රුපියල් 350.00 ක සහනාධාර පොහොර ප්‍රමාණය කොපමණද;

(iv) මෙම කොට්ඨාසය තුළ ඇති ඇලවේලි අමුණු ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වෙන්කර තිබෙන මුදල එක් එක් ව්‍යාපෘතියට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) "අපි වවමු - රට නගමු" වැඩ සටහන ආරම්භ කිරීමෙන් පසුව පුරන් කුඹුරු අස්වැද්දීමට ගොවීන් උනන්දු කිරීම සඳහා ඉහත කොට්ඨාසය තුළ ඇලවේලි අමුණු සකස්කිරීම සඳහා වාර්ෂිකව වැයකර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා පුරන් වූ කුඹුරු ප්‍රමාණයේ ප්‍රතිශතය කොපමණද;

(iii) සියලුම කුඹුරු වගා කරවීමට කවර කාල සීමාවක් තුළ පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0376/'09

5.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 9 වැනි පිටුවේ (සිංහල මාධ්‍ය) යෝජනා කර ඇති පරිදි, උපතේ සිට වසර පහ දක්වා දරුවන්ට කිරි මිලදී ගැනීම සඳහා මසකට රුපියල් 200 ක් බැගින් ලබාදීම මේ වන විට ක්‍රියාත්මක කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට ඉහත රුපියල් 200 මුදල ලබාදීම ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) මෙම රුපියල් 200 බැගින් වන මුදල ලබාදී තිබෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0031/'09

6.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඇති මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004 අප්‍රේල් 01 වැනි දින සිට මේ දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ බලපත්‍ර නිකුත් කර අලුතින් විවෘත කරන ලද මත්පැන් අලෙවිසැල්, විදේශීය මත්පැන් අලෙවිසැල්, අවන්හල් සහ හෝටල් සංඛ්‍යාව කොපමණද;

(ii) මැතිවරණ කොට්ඨාස මට්ටමින් ඒවායේ නම් සහ 2004 සිට 2007 දක්වා සෑම වර්ෂයකම අවසානයේදී සහ මේ දක්වා මෙම නව මත්පැන් අලෙවිසැල්වලින් උපයන ලද ආදායම කවරේද;

(iii) 1998 සිට 2003 දක්වා සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වැනි දිනට ඉහත (i) ට අදාළ තොරතුරු සහ කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා මුලු ආදායම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0109/'09

7.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය චිත්‍රපට සංස්ථාවේ සේවයේ නියුතු නීති නිලධාරිනියගේ පත්වීමේ දිනය හා බඳවාගත් පදනම කවරේද;

(ii) එම නිලධාරිනිය බඳවා ගැනීමට, සේවය ස්ථිර කිරීමට හා එම අයගේ වැටුප් තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය විධිමත්ව ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත අනුමතිය ලබා දී ඇති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ඇතුළත් ලේඛන එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත නිලධාරිනිය අදාළ සංස්ථාව වෙත හා අදාළ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති ජීව දත්ත තොරතුරු පරස්පරතා සහිත අසත්‍ය ඒවාද;

(ii) එම නිලධාරිනියගේ වැටුප් හා දීමනා කවරේද;

(iii) ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත කරුණු පිළිබඳව අක්‍රමිකතා සිදුවී ඇත්නම් ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0200/'09

8.

ගරු ජේමසිරි මානගේ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් 2008 ජනවාරි මස සිට මේ දක්වා සිදුකර තිබෙන විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ අමාත්‍යතුමා විසින් සංචාරය කරන ලද රටවල් කවරේද;

(iii) ඒ සඳහා වැයකර තිබෙන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0353/'09

9.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගා/නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනාරක්ෂිත ස්ථානවල පදිංචිව සිටි අයගේ නිවාස 2003 ගංවතුරින් විනාශ වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔවුන් අතුරින් කොපමණ සංඛ්‍යාවකට තල්ගස්වල වතුයායෙන් ඉඩම් ලබාදී තිබේද;

(ii) එසේ වන්දි ලබාදීමට නියමිතව ඇති අයට ගෙවීමට ඇති හිඟ වන්දි ප්‍රමාණය කොපමණද;

(iii) එම අයට නිවාස සාදාගැනීම සඳහා අනුමතවූ හිඟ වන්දි මුදල් කොපමණ කාලසීමාවක් තුළ ලබාදෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත අනාරක්ෂිත ස්ථානවලම නිවාස තිබී ඒවා විනාශ වුවද, අනුමතවූ ඉඩම් නොලැබීම නිසා අනාරක්ෂිත ස්ථානවල තම නිවාස නැවත සකස්කරගත් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) එම අයට නිර්වන්දි ගිවිසුමක් යටතේ ඉදිරි ආපදාවකදී වන්දි ගෙවීමට හැකි බවට නාගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් අදාළ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට දන්වා ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) එසේනම් ඉදිරි ආපදාවකදී නොව 2003 වර්ෂයේදී නිවාස විනාශ වීමෙන් වන්දි ගෙවීමට අනුමතවී එහෙත් ඉහත අනාරක්ෂිත ස්ථානවලම නිවාස සාදාගෙන සිටින අයට අනුමත හිඟ වන්දි මුදල කොපමණ කාලසීමාවක් තුළ ලබා දෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0377/'09

10.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 8 වැනි පිටුවේ (සිංහල මාධ්‍ය) යෝජනා කර ඇති පරිදි, තමන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරා ගැනීමට අසමත් ගැබිණි මාතාවන්ට පෝෂණ මල්ලක් නොමිලේ ලබාදීම මේ වන විට ක්‍රියාත්මක කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට එම පෝෂණ මල්ල ලබාදීම ක්‍රියාත්මක කර ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) ඒ අනුව පෝෂණ මල්ල ලබාදී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0033/'09

11.

ගරු රවි කරුණානායක මහතා,— ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි සහනාධාර ලැබීමට අවශ්‍ය සුදුසුකම් කවරේද;

(ii) 1995 වර්ෂයේ සිට මේ දක්වා සමෘද්ධි සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(iii) එම කාලසීමාව තුළ සමෘද්ධි ප්‍රතිලාභීන්ට ලබා දෙන ලද මුදල් ආධාරය හා ප්‍රතිශතය කවරේද;

(iv) 2005 වර්ෂයෙන් පසුව සමෘද්ධි ප්‍රතිලාභීන්ට ලබාදුන් වැඩිවීම් ඔවුන්ට ලැබුණේද;

(v) එසේ නම්, එම දිනය හා ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 වර්ෂය පාදක වර්ෂය ලෙස ගනිමින් 2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලසීමාව තුළ කොළඹ දිස්ත්‍රික්කයට අදාළව —

(i) සමෘද්ධිලාභීන් ලබා ඇති මුදල් ප්‍රමාණය රුපියල් වලින් කොපමණද;

(ii) එක් එක් වසරේ උද්ධමනය කොපමණද;

(iii) එක් එක් වසර තුළ උද්ධමනය අවකරණය කළ පසු මූර්ත ක්‍රය ශක්තිය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0201/'09

12.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 වර්ෂය තුළ ධීවර වරායන් ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීමක් සිදුකර තිබේද;

(ii) එසේනම් එම ස්ථාන සහ අදාළ දිනයන් කවරේද;

(iii) මුල්ගල් තැබීම සිදුකළ ස්ථානවල ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබේද;

(iv) එසේනම් ඒ කවර ස්ථාන වලද;

(v) අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළේ කවදාද;

(vi) මේ වන විට එම ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0354/'09

13.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) 2000 වර්ෂයේ සිට 2008 දෙසැම්බර් දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික නිම් තේ නිෂ්පාදනය හා ඒ අතුරින් අපනයනය කරන ලද තේ කිලෝග්‍රෑම් ප්‍රමාණය අදාළ රටවල් ද සමඟ කවරේද;

(ii) තේ අපනයනයෙන් අප රට ලැබූ ආදායම කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කාලය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කළ තේ ප්‍රමාණ සහ එම රටවල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) තේ ආනයනයට වැයකළ සම්පූර්ණ මුදල වාර්ෂිකව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වෙනත් රටවල් විසින් අප රටෙන් තේ ඇණවුම් කරන විට එම ඉල්ලුම්කරුවන් වෙනත් රටවල තේ ද (උදාහරණ: ඇසෑම් තේ) ඇණවුම් කරන බවට අදාළ උපදේශක කාරක සභා රැස්වීමේදී නිලධාරීන් දන්වා සිටි බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ ඇණවුම් කරන ලද විදේශ රටවල තේ ප්‍රමාණයන් සහ තේ වර්ග අදාළ රටවල්ද සමගින් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) ඉහත ඇණවුම්වල පිටපත් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඊ) ශ්‍රී ලංකාවේ ඉතා හොඳ තත්වයේ තේ නිපදවද්දී, තේ ආනයනය කර ශ්‍රී ලංකා තේ සමග මිශ්‍රකර අපනයනය කිරීමෙන් අපේ තේ අපනයනයට ප්‍රබල හානියක් සිදුවන බැවින් තේ ආනයනය නතර කිරීමට එතුමා කඩිනම් පියවර ගන්නෙහිද?

(උ) නොඑසේ නම්, ඒ මන්ද ?

0378/'09

14.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) නෙදර්ලන්ත රජය විසින් ශ්‍රී ලංකාවට ලබාදෙන සියලු ආධාර සම්පූර්ණයෙන්ම නවතා ඇති බවට නෙදර්ලන්ත පාර්ලිමේන්තුව තුළ, එරට රජය වෙනුවෙන් අමාත්‍යවරයෙකු ප්‍රකාශ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම ආධාර නවතා දැමීමට හේතුව, ශ්‍රී ලංකාව තුළ සිදුවන උග්‍ර මානව හිමිකම් උල්ලංඝණය වීම, සිවිල් ජනතාවගේ මරණ සහ නීතියේ උත්තරීතරභාවය පළුදු කිරීම බවට එම ප්‍රකාශයේ සඳහන් වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නෙදර්ලන්ත රාජ්‍යය සමග නැවත යහපත් සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව,— වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා ද; වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය නිශ්චිතව දැක්වීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

ගරු ලලිත් දිසානායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

" රෝහිත අබේගුණවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත —දෙවැනි වර කියවීම.

*2.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 149— වැඩසටහන 2,— † 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දෙසීයයකට (රු. 200,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| ශීර්ෂය | 149 | — | කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන වැඩසටහන | | |
| | | | මූලධන වියදම් | රු. | 200,000,000 |
| | | | | රු. | 200,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ජුනි මස 12 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 3 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සහ 2 එකතුව රුපියල් 2,749,830,000.

*4.

ප්‍රවාහන අමාත්‍යතුමා— පරිපූරක මුදල — ශීර්ෂය 114— වැඩසටහන 2,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් දශ ලක්ෂ දෙදහස් දෙසීය අනූනමයයි දශම අටයි තුනකට (රු.ද.ල. 2,299.83) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 114 | — | ප්‍රවාහන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන කටයුතු | |
| | | | පුනරාවර්තන වියදම් | රු.ද.ල. 2,299.83 |
| | | | | රු.ද.ල. 2,299.83 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ජුනි මස 12 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රුපියල් 450,000,000.

*5.

සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*13.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*14.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*16.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*17.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*18.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*19.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04)[1]

*20.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචානාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*26.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*27.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

28.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

29.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

30.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.